**ත්‍යාග හා දිරිදීමනා අරමුදල - 2016**
**-----------------------------------------**

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ත්‍යාග හා දිරිදීමනා අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2009 අංක 8 දරන මෝටර් රථ ප්‍රවාහන (සංශෝධන) පනතින් සංශෝධනය කරන ලද මෝටර් රථ ප්‍රවාහන පනතේ (203 අධිකාරය) 213 ඇ (5) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**---------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

------

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ත්‍යාග හා දිරිදීමනා අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

--------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල දිරිදීමනා ආදායම රු. 101,115,117 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල එය රු.100,497,621 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් දිරි දීමනා ආදායම රු.617,496 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට සහ සමාලෝචිත වර්ෂයට අදාලව නොගෙවූ එකතුව රු. 856,597 ක දිරි දීමනා මුදල උපචිත වියදම් යටතේ ගිණුම්ගත කිරීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

#### 2.2.2 පැහැදිලි නොකල වෙනස්කම්

------------------------------

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට අනුව සමාලෝචිත වර්ෂයට අදාල දිරි දීමනා වියදම රු. 96,423,178 ක් වුවද ඊට අදාල උපලේඛනයේ එය රු. 96,169,280 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු. 253,898 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවල අනුකූල නොවීම්

----------------------------------------------------------------------

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ් 423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව, අරමුදලේ කටයුතු වෙනුවෙන් ගෙවීමට ඇති මුදල් හා අනෙකුත් වගකීම් නිරවුල් කිරීමෙන් පසු ඉතිරිවන අතිරික්තයක් වේ නම්, එය අප්‍රමාදව ඒකාබද්ධ අරමුදලට මාරු කල යුතුය. එහෙත් 2016 දෙසැම්බර් 31 දිනට අරමුදලේ පැවති රු. 18,132,382 ක අතිරික්තය ඒකාබද්ධ අරමුදලට මාරු කර නොතිබුණි. එසේම අරමුදලේ ගිණුම් සසඳා ප්‍රගතිය පිළිබඳ එක් එක් කාර්තුව සඳහා වූ වාර්තා ද රාජ්‍ය මුදල් අධ්‍යක්ෂක ජනරාල්වරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

### 2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

------------------------------------------------------

2006 අප්‍රේල් 25 දිනැති අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 06 (ඇ) උපඡේදය අනුව සියලුම දීමනා හා දිරිකාරක ගෙවීම් පිළිබඳව ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව සමග සාකච්ඡා කර අවශ්‍ය උපදෙස් ලබා නොගෙන ඉකුත් වර්ෂවලදී මෙන්ම සමාලෝචිත වර්ෂයේදී ද කාර්ය මණ්ඩලය සඳහා දිරි දීමනා ගෙවා තිබුණි. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් සකස් කල ක්‍රමවේදයකට අනුව දිරි දීමනා ගෙවීම සඳහා සමාලෝචිත වර්ෂයේ දී රු. 96,423,178 ක් වැය කර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

---

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.2,692,728 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.3,032,467 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.339,739 ක පිරිහීමක් නිරීක්ෂණය විය. 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේ දිරිදීමනා ආදායම රු. 14,481,756 කින් හෙවත් සියයට 14 කින් අඩුවී තිබීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---

### 4.1 කාර්යසාධනය

---

මෝටර් රථ ප්‍රවාහන පනතේ 23 (ඈ) වගන්ති ප්‍රකාරව පනවා ඇති නියෝග අංක 3 අනුව දිරි දීමනා ගෙවීම් වලට අමතරව විවිධ කාර්යයන් සඳහා ද ත්‍යාග හා දිරිදීමනා අරමුදලේ මුදල් වැයකල හැකි බව අවධාරණය කර තිබිණි. එහෙත් අරමුදලේ ලැබීම් වලින් සියයට 95 කට වැඩි ප්‍රමාණයක් දිරිදීමනා ගෙවීම් සඳහා පමණක් වැය කර ඇති බව නිරීක්ෂණය විය. ඒ අනුව පහත සඳහන් අරමුණු වෙනුවෙන් අරමුදලේ මුදල් වැයකිරීම සඳහා වගකිව යුතු පාර්ශවයන්ගේ අවධානය යොමුවී නොතිබුණි.

(අ) මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව යම් මෝටර් රථයක් සකස් කිරීමේ, නිෂ්පාදනය කිරීමේ, එකලස් කිරීමේ, අළුතින් නිර්මාණය කිරීමේ, අනුවර්තනය කිරීමේ, විකරණය කිරීමේ හා නිර්මාණය වෙනස් කිරීමේ නියුක්තව සිටින තැනැත්තන් පිළිබඳ තොරතුරු සපයන පාර්ශවයන් වෙත මුදල් ගෙවීම.

(ආ) ඇතැම් සාවද්‍ය ක්‍රියා හඳුනාගැනීම සඳහා තොරතුරු සපයනු ලබන හෝ එවැනි සාවද්‍ය ක්‍රියා අනාවරණය කර ගැනීමේ යෙදී සිටින තැනැත්තන්ට මුදල් ගෙවීම.

(ඇ) අවුරුද්දකට රු.100,000 ක් දක්වා වූ උපරිමයකට යටත්ව දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ පුහුණු හා අධ්‍යාපන කටයුතු සඳහා මුදල් යෙදවීම.

(ඈ) ප්‍රශංසාත්මක හෝ විශේෂ ඇගයීමක් අවශ්‍ය වන්නාවූ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ ක්‍රියාකාරකම් සඳහා වර්ෂයකට රු.50,000 ක් නොඉක්මවන පරිදි මුදල් ගෙවීම.

### 4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්

---

සහනදායී බලපත්‍ර යටතේ ආනයනය කරනු ලබන වාහන පැවරීමේදී අයකරනු ලබන ගාස්තු දිරිදීමනා යෝජනා ක්‍රමයට අදාල නොවූවද එම ගාස්තුවෙන් සියයට 1ක ප්‍රමාණයක් ද දිරිදීමනා අරමුදලට බැර කර තිබුණි. 2014 හා 2015 වර්ෂ වලදී එසේ දිරිදීමනා අරමුදලට බැර කර තිබූ මුදල පිළිවෙලින් රු.6,160,646 ක් හා රු.1,273,712 ක් වූ අතර එම මුදල් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් දිරිදීමනා අරමුදලේම රඳවාගෙන තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
-----------------------------------------

### 5.1 අයවැය ලේඛනමය පාලනය
------------------------------

වැය විෂයන් 06 කට අදාලව අයවැයගත වියදම් සහ තථ්‍ය වියදම අතර සියයට 65 ත් සියයට 100 ත් දක්වා වූ පරාසයක විචලනයන් නිරීක්ෂණය වීමත් ආදායම් විෂයයන් 02 කට අදාල ආදායම ඇස්තමේන්තුකර නොතිබීමත් හේතුවෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

### 5.2 ක්‍රියාකාරී සැලැස්ම
--------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අරමුදල විසින් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කලයුතු වුවද, 2016 වර්ෂයට අදාලව අරමුදල විසින් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්
----------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර කොමසාරිස් ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | දිරි දීමනා නිවැරදිව ගණනය කර ගිණුම් තැබීමට කටයුතු නොකිරීම. |
| (ආ) මූල්‍ය පාලනය | බැංකු ගිණුම් සඳහා වෙන වෙනම ලෙජර් ගිණුම් පවත්වා නොතිබීම. |